**නාවික සංවර්ධන අරමුදල - 2015**

**------------------------------------------**

නාවික සංවර්ධන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශනය පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3. විගණකගේ වගකීම

**---------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 අරමුදලේ පාලනය හා පැවැත්ම

**-------------------------------**

1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශ පනත යටතේ නැව් නියෝජිතයන්ගෙන් අයකළ ගාස්තු හා කොමිස් මුදල් උපයෝගීකර ගනිමින් අරමුදල පිහිටුවා පවත්වාගෙන ගොස් ඇතත් 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස නෛතික පසුබිමක් සහිතව පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අධීක්ෂණය හා පාලනය යටතේ අරමුදලේ කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. 2011 මැයි 24 දිනැති අංක පීඊ/සීඕපී/(4)31ජීඊඑන් දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපියේ උපදෙස් මත 2011 වර්ෂයේදී අරමුදලේ පැවති මුදලින් රු.මිලියන 46.47 ක් නව මගී පර්යන්තයක් ඇරඹීම සඳහා ආයෝජනය කිරීමට සී.ස. ලංකා නැව් සංස්ථාවට මුදාහැරීමෙන් පසු අරමුදලේ පැවති ඉතිරි මූල්‍යාමය වත්කම් සියල්ල උපලබ්ධිකර ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු නොවුණු හෙයින් අරමුදලට අදාලව ආදායම් උත්පාදනයක් හෝ වියදම් ප්‍රභවය වීමක් සිදුවී නොතිබුණි. එහෙයින් මේ වනවිට අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් මතුවී තිබුණි.

## 1.5 මතය ව්‍යාචනය සඳහා පදනම

**-------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

ජනාධිපති කාර්යාලයට හා අධ්‍යාපන අමාත්‍යාංශයට අරමුදලින් පිළිවෙලින් ලබා දී තිබූ රු.366,691,764 ක හා රු.946,095 ක මුදල් සම්බන්ධව කිසිදු ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවූ අතර සී/ස ලංකා නැව් සංස්ථාවට ලබා දී තිබූ රු. 55,000,000 ක මුදල මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත ලබාගත් බවත් එය ලංකා නැව් සංස්ථාවේ වගකීමක් නොවන බවත් විගණනය වෙත වාර්තා කර තිබුණි. මේ අනුව මූල්‍ය ප්‍රකාශන තුළ වත්කම් ලෙස පෙන්නුම් කෙරෙන සමස්ථ වටිනාකම වූ රු. 422,637,859 ක් සඳහා ශේෂ සනාථ නොලැබීම හා අදාළ ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස නොදැක්වීම මත මුදල් අයවීම අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

2011 වර්ෂයේ සිට අරමුදලේ මෙහෙයුම් කටයුතු අත්හිටුවා තිබූ බැවින් අරමුදල සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශයක් හෝ සමුච්චිත අරමුදලේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්යසාධනය

2011 වර්ෂයේදී රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝගයක් මත ණයගැතියන් හැර අනෙකුත් මූල්‍යමය වත්කම් ඒකාබද්ධ අරමුදලට බැරකිරීමෙන් පසු අරමුදලේ සියලුම මෙහෙයුම් කටයුතු අත්හිටුවා තිබුණි. කෙසේවෙතත්, අක්‍රීයව පවතින අරමුදල අදාල පාර්ශවයන්ගේ නිසි උපදෙස් මත ඈවර කිරීමට 2011 වර්ෂයේ සිට මේ දක්වා කටයුතු කර නොතිබුණි.